සැ. යු. — (i) මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2011 වර්ෂයේ අප්‍රේල් සිට ජුනි දක්වා වූ කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

(ii) 2013.08.23 වැනි දින පළ වූ අංක 1,825 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,826 - 2013 අගෝස්තු මස 30 වැනි සිකුරාදා - 2013.08.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1764 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1765 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 සැප්තැම්බර් මස 20 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 සැප්තැම්බර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## සභා ලේකම් කාර්යාලය, නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය

තනතුරු පුරප්පාඩු

නැගෙනහිර පළාත් සභා ලේකම් කාර්යාලයේ දැනටමත් පුරප්පාඩු වී ඇති පහත සඳහන් ප්‍රාථමික (ශිල්පීය නොවන) "දෙපාර්තමේන්තු කම්කරු" තනතුරට බඳවා ගැනීම සඳහා නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු :

(1) නිවාස පාලක III ශ්‍රේණිය - 01
(2) පාලක III ශ්‍රේණිය - 01

02. *වැටුප් පරිමාණය.-* මෙම තනතුරට අයත් වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක (06/2006(iv) ට (PL-2006A) අනුව රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 වේ

03 *බඳවා ගැනීම් පොදු කොන්දේසි :*

3.1 ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්ව වසර 06කින් වසර 03ක් නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.

3.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

3.4 සියලුම අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා නැගෙනහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතු යි.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.-*

4.1 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය.

4.2 වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.

4.3 පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් ය. II වැනි, I වැනි හා විශේෂ පන්තියේ තනතුරකට උසස් කරනු ලබන සෑම තැනැත්තෙකුම එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් විය යුතු යුතු ය.

4.4 III වැනි පන්තියේ තනතුරු දරන්නන් තුන් අවුරුදු ආධුනික කාලය තුළ ඔවුන්ගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් හා කාර්යක්ෂමතා කඩඉම සමත්වන්නේ නම්, තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

4.5 ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු කොන්දේසි අදාළ විය යුතු ය.

4.6 රජය, පළාත් සභාව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, විසින් දැනටමත් නියම කර ඇති හා කලින් කල නියම කරනු ලබන කොන්දේසිවලට යටත් විය යුතු ය.

4.7 2007.05.28 දිනැති 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව 2007.07.01 වැනි දින සිට පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුන භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතු ය. මේ සඳහා සභා ලේකම් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

05 *අධ්‍යාපන සුදුසුකම්.-*

5.1 දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.

6. බඳවා ගැනීමේ පන්තියට නියමිත වැටුප් පරිමාණයේ හතර වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

7. *බඳවා ගැනීමේ ක්‍රමය.-* සියලුම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය, ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් වන අතර, ඒ සඳහා පහත සඳහන් ලිපි ලේඛන හා ඒවායේ ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අදාළ අධ්‍යාපන සහතිකයේ/විදුහලේ අස්වීමේ සහතිකය ;
(iii) මෑතක දී ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය ;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික ;
(v) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ;
(vi) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ;
(vii) පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය හෝ ඡන්ද නාමලේඛනයේ උද්ධෘතයක්.

8. *අයදුම් කළ යුතු ආකාරය.-*

8.1 එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පත්‍රයක් පමණි.

8.2 නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි A4 ප්‍රමාණයේ කොළයක දෙපැත්තම භාවිතා කර සකස් කරන ලද අයදුම්පතක් 2013.09.10 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, "ලේකම්, සභා ලේකම් කාර්යාලය, නැගෙනහිර පළාත් සභාව, ත්‍රිකුණාමලය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. (අයදුම්පත පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.)

8.3 අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "දෙපාර්තමේන්තු කම්කරු" යන්න සඳහන් කළ යුතු ය.

8.4 අසම්පූර්ණ හෝ නියමිත දින පසුවී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු හෝ ග්‍රාම නිලධාරි විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

9. පත්වීම ක්‍රියාත්මක වන දිනය ලේකම්, සභා ලේකම් කාර්යාලය මගින් නියම කරනු ලැබේ.

කේ. කරුණාගරන්,
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
නැගෙනහිර පළාත් සභාව.

**ආදර්ශ ඉල්ලුම්පත්‍රය**

***නැගෙනහිර පළාත් සභා ලේකම් කාර්යාලයේ දෙපාර්තමේන්තු කම්කරු ශ්‍රේණියේ තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය***

1. මුලකුරු සමග නම :—————.
   1.1 මුලකුරුවලින් හැඳින්වෙන නම :—————.

2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
   2.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————.
   2.2 ග්‍රාම සේවා කොට්ඨාස අංකය :—————.
   2.3 නම :—————.

3 ස්ථිර ලිපිනය :—————.

4 ජාතික හැඳුනුම්පත් අංකය :—————.

5 ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
විවාහක/අවිවාහක බව :—————.

6 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස ඃ
අවුරුදු :————, මාස :————, දින :————.

7 නැගෙනහිර පළාත් සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය ඃ
අවුරුදු :————, මාස :————, දින :————.

8 ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද යන වග :—————. තොරතුරු සඳහන් කරන්න. :—————.

9 අධ්‍යාපන සුදුසුකම් ඃ (සමත් විභාග පිළිබඳ විස්තර)

(i) විභාගයේ නම :—————.
(ii) විභාගය පැවති වර්ෂය හා මාසය :—————.
(iii) විභාග අංකය :—————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

10. වෘත්තීය සුදුසුකම් ඃ (සහතික මගින් සනාථ කළ යුතු ය.)

11 සේවා පළපුරුද්ද :—————.

12 ඔබ කවරදාක හෝ චෝදනාවක් මත උසාවියකින් වරදකරු කර තිබේ ද? :—————. එසේ නම් ඒ පිළිබඳ විස්තර :—————.

13 අයදුම්කරුගේ සහතිකය :—————.

මෙම ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇති යම්කිසි විස්තරයක්/තොරතුරුක් අසත්‍ය බව හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා තනතුරට නුසුදුස්සකු වන බවත්, මා තනතුරකට පත් කිරීමෙන් පසු තොරතුරු/විස්තර වැරදි හෝ අසත්‍ය බව සොයා ගතහොත් එයින් මා තනතුරට නුසුදුස්සකු වන බවත්, කිසිම වන්දියක් නොමැතිව තනතුරෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මා දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන................................................ මහතා/මහත්මිය/මෙනවිය .................. වැනි දින..................... දී මා ඉදිරියේ දී අත්සන් කළ බව සහතික කරමි.

සහතික කරන නිලධරයාගේ අත්සන :—————.
නම :—————.
නිල මුද්‍රාව :—————.
දිනය :—————.

08-891

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාග - 2013**

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින පහත දක්වා ඇති තනතුරුවලට බඳවා ගැනීම සඳහා මතු සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් මෙම කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2013.10.31 දින වේ.

| *සංකේත අක්ෂරය* | *තනතුර* | *සීමිත/විවෘත* |
|---|---|---|
| A | ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය | විවෘත |
| B | ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය | සීමිත |

02. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කෙරේ. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේ දී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව, පහත පරිදි බඳවා ගන්නා අතර බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

| *සංකේත අක්ෂරය* | *තනතුර* | *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|---|---|
| A | ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය | විවෘත | 70% |
| B | ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය | සීමිත | 30% |

03. සුදුසුකම් ඃ

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
(ii) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) *පදිංචිය සනාථ කිරීම :*

A - ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය - විවෘත තරග විභාගය

දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු අතර අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් අයදුම් කරනු ලබන දිස්ත්‍රික්කය තුළ පදිංචිය සනාථ කළ යුතු ය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය.

B - ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය - සීමිත තරග විභාගය

මෙම අයදුම්කරුවන්ට උක්ත වගන්තිය අදාළ නොවේ.

(iv) මෙම අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම ඒ ඒ තනතුරුවලට අදාළව පහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

A - ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය - විවෘත තරග විභාගය

*(අ)* සිංහල/දෙමළ, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සහ*

*(ආ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

B - ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය - සීමිත තරග විභාගය

*(අ)* සිංහල/දෙමළ, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සහ*

*(ආ)* දකුණු පළාත්, පළාත් පාලන සේවයේ ප්‍රාථමික ශ්‍රේණියට අදාළ ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය හෝ ශිල්පීය ශ්‍රේණියක වසර 10ක ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට, අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

04. *වයස :*

A - ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය - විවෘත තරග විභාගය

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. කෙසේ වෙතත් දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක යෙදී සිටින අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

B - ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය - සීමිත තරග විභාගය
සීමිත තරග විභාග සඳහා මෙම වයස් සීමාවන් අදාළ නොවේ.

05. *වැටුප් ක්‍රමය :*

A - ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(iv) MN 1-2006 - A අනුව මාසික වැටුප් පරිමාණය රු. 13,120-10x45-11x170-10x240-10x320-22,040 වේ.

06. *සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි :*

*(අ)* මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

*(ආ)* විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලබන අයදුම්කරුවන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන්නේ ය. නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීම හා ඔහු/ඇය පරිවාස කාලය තුළ රාජකාරියේ වැඩ හා හැසිරීම හා පැමිණීම සතුටුදායක බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමකට පත්වන්නේ නම් වසර තුන අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලබන නිලධාරියකු එක් වසරක (01) වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු/ඇය වැඩ බැලීමේ කාලය තුළ රාජකාරියේ වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේනම් සහ අනෙකුත් කොන්දේසි සපුරා තිබේනම් වැඩ බැලීමේ කාලය අවසානයේ දී තනතුරේ ස්ථිර කරනු ලැබේ.

07. *මාධ්‍ය :*

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍ය තුනෙන්ම පැවැත් වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

08. *විභාග ක්‍රමය :*

A - ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය - විවෘත තරග විභාගය

අපේක්ෂකයන් පහත සඳහන් විෂයයන් ඇතුළත් ලිඛිත විභාගයකට පෙනී සිටිය යුතු ය. (රාජකාරී කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.)

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 1 |
| භාෂා හැකියාව | 100 | 40% | පැය 1 |

1. *බුද්ධි පරීක්ෂණය.-* අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

2. *භාෂා හැකියාව.-* අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා විභාගයේ මුලු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක් (50%) ලබා ගත යුතු වේ.

B - ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය - සීමිත තරග විභාගය

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම | 100 | 40% | පැය 1 |
| භාෂා හැකියාව | 100 | 40% | පැය 1 |

1. *සාමාන්‍ය දැනීම.*-රාජකාරි සඳහා අපේක්ෂකයා සතු කුසලතාවයන් හා යෝග්‍යතාවයන් පරීක්ෂා කෙරෙන සමාජ ආර්ථික පසුබිම, දේශීය තොරතුරු, අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වැඩසටහන් හා ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රශ්න ඇතුළත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

2. *භාෂා හැකියාව.*- අක්ෂර වින්‍යාසය, වියරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක් (50%) ලබා ගත යුතු වේ.

09. *විභාගය පැවැත්වීමට යෝජිත දිස්ත්‍රික්ක :*

විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජිත නගරයන් පහත පරිදි වේ. යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වූ විට විභාගය ආසන්නතම නගරයේ දී පවත්වනු ඇත. අයදුම්කරුවන්, නගරය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරු ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයේ පහත සඳහන් නගරයක් පමණි.

| *දිස්ත්‍රික්කය* | *නගරය* |
|---|---|
| ගාල්ල | ගාල්ල |
| මාතර | මාතර |
| හම්බන්තොට | තංගල්ල |

10. *අයදුම්පත්‍ර :*

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A 4 (සෙ. මී. 21x30) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතු ය. අංක 01 සිට 09 දක්වා ශීර්ෂ පළමුවන පිටුවට ද, අංක 10 සිට 12 දක්වා ශීර්ෂ දෙවන පිටුවට ද ඉතිරිය තුන්වන පිටුවට ද ඇතුළත් වන පරිදි සකස් කර ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. අයදුම්පත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk මඟින් ද ලබා ගත හැකි ය.

(ආ) නිවැරදිව සකස් කරන ලද අයදුම්පත් 2013.10.31 දිනට පෙර, "ලේකම්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 06 වැනි මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, ගාල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "දකුණු පළාත් රාජ්‍ය සේවයේ .......................................... තනතුරට බඳවා ගැනීමේ .............................................................(සීමිත/විවෘත යන බව දක්වන්න.) තරග විභාගය - 2013 - ..............................................දිස්ත්‍රික්කය" (ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය දක්වන්න.) යනුවෙන් සඳහන් කළ යුතු ය. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු සහතික පත්‍රයක්/ඡායා පිටපතක්, අයදුම්පත සමග අමුණා නොඑවිය යුතු ය.

(ඇ) ඉල්ලුම්පත්‍රය සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.

(ඈ) රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති හා ඉල්ලුම්පත්‍ර කැඳවන අවසාන දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සි ඇතුළත් අයදුම්පත්, මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම කොමිෂන් සභාව විසින් වග කියනු නොලැබේ. ඉල්ලුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

(ඊ) අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

11. *විභාග ගාස්තු.*-

(අ) මෙම විභාගය සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවෙකු විසින් ම විභාග ගාස්තු ලෙස රු. 400 ක මුදලක් දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 2003-10-13 දරන අය ශීර්ෂයට බැරවන පරිදි දකුණු පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම දැන්වීමේ සඳහන් නොවන අයුරින් මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත් සහිත අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. තව ද, අපේක්ෂකයින් විභාග ශාලාව තුල දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

විභාගය පැවැත්වීමට දින 07කට කලින් ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයන් පහත සඳහන් විස්තර ඇතිව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලියා හෝ දුරකථන අංක 091-2234309 ඔස්සේ දැන්විය යුතු ය.

(i) විභාගයේ නම :————.
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(iii) සම්පූර්ණ ලිපිනය :————.
(iv) ඉල්ලුම්පත් තැපැල් කළ කාර්යාලය, ලියාපදිංචි කළ අංකය හා දිනය :————.

අයදුම්පත්‍ර නොලැබී හෝ අස්ථානගත වීමක් හේතුවෙන් ප්‍රවේශ පත්‍ර නොලැබී ගියහොත් ප්‍රවේශපත්‍රය ලබා ගැනීමට අයදුම්පත්‍රයේ පිටපතක් සමග ලියාපදිංචි කළ කුවිතාන්සියේ පිටපතක් රැගෙන කොමිෂන් සභා කාර්යාලයට අයදුම්කරු හෝ අයදුම්කාරිය විසින්ම පැමිණිය යුතු ය.

12. *තෝරා ගැනීමේ ක්‍රමය :-*

*(අ)* A - ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය - විවෘත තරග විභාගය

මෙම තනතුරු සඳහා ඉහත 08 ඡේදයේ දක්වා ඇති පරීක්ෂණවලින් දක්වන ලද කුසලතාවය හා රා. ප. ච. 15/90 හි සඳහන් විධිවිධාන හා දිස්ත්‍රික් ජනගහන අනුපාතයට අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. (පත්වීම් ප්‍රදානයේ දී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් දිය යුතු අවසාන ප්‍රමුඛතා මට්ටමේ සම ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිප දෙනෙකු සිටින අවස්ථාවක දී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යාපන සුදුසුකම් අනුව ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙලින් තෝරා ගැනේ.)

B - ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය - සීමිත තරග විභාගය

මෙම තනතුරු සඳහා ඉහත 08 ඡේදයේ දක්වා ඇති පරීක්ෂණවලින් දක්වන ලද පළාත් කුසලතාවය අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. (පත්වීම් ප්‍රදානයේ දී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් දිය යුතු අවසාන ප්‍රමුඛතා මට්ටමේ සම ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිප දෙනෙකු සිටින අවස්ථාවක දී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යාපන සුදුසුකම් අනුව ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙලින් තෝරා ගැනේ.)

*(ආ)* සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව සෑම අයදුම්කරුවෙකුටම විභාගයට ඉදිරිපත් වීම සඳහා අවස්ථාව ලබාදෙනු ලැබේ. විභාග ප්‍රතිඵල මත කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර අයදුම්පත් කැඳවන අවසාන දිනට, නිවේදනය ප්‍රකාර සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් පත්වීමක් ලැබීමට සුදුසුකම් නොලබන්නේ ය.

13. *සාවද්‍ය තොරතුරු සැපයීම :-*

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවාගත් පසුව වුව ද, අපේක්ෂකයකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරිපත් කර ඇති බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව අවසාන තීරණයක් ගැනීම දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේ ය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර සංවිධානාවයක් මතු වුවහොත් සිංහල නිවේදනය බල පැවැත් වේ.

සමන් දර්ශන පාඩිකෝරාල,
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2013 අගෝස්තු මස 01 වැනි දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
6 වැනි මහල,
ගාල්ල.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු සහිත අයදුම්පත්‍ර කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

ආදර්ශ අයදුම්පත්‍රය

තනතුරට අදාළ සංකේත අක්ෂරය : ☐ (A/B) විවෘත/සීමිත : ☐

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ☐

දකුණු පළාත් රාජ්‍ය සේවයේ................................ තනතුරට බඳවා ගැනීමේ ..................................... තරග විභාගය - 2013

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා) : ☐

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : (සිංහල-2, දෙමළ-3, ඉංග්‍රීසි-4)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න) : ☐

විභාග නගරය : ☐

(විභාග නිවේදනයේ 11 වැනි ඡේදය බලන්න.)

01. අයදුම්කරුගේ මුල‍්‍ාකුරු අගට යොදා මුල‍්‍ාකුරු සමඟ නම :
   (i) සිංහලෙන් :————.
   (ii) ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරෙන්) (Mr./Mrs./Miss) :———.
   උදාහරණ : NIMAL M.A.S., නිමල් එම්.ඒ.එස්.

02. මුල‍්‍ාකුරු වලින් හැඳින්වෙන නම් :
   (i) සිංහලෙන් :————.
   (ii) ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරෙන්) :————.

03. (i) ස්ථිර ලිපිනය :————.
   (ii) සේවා ස්ථානයේ නම හා ලිපිනය :————.
   (iii) දුරකථන අංකය :————.

04. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :
   (i) සිංහලෙන් :————.
   (ii) ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරෙන්) :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0 ☐
   (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

06. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

   නිකුත් කළ දිනය :————.

07. විවාහක/අවිවාහක බව : අවිවාහක - 1, විවාහක - 2 ☐
   (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

08. උපන් දිනය :

   වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

09. අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :

   අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

09. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ? ලියාපදිංචියෙන් ද? :————.

(i) ඔබගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාස :————.
(iv) දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින කාලසීමාව ..................... දින සිට ................. දින දක්වා

10. *අධ්‍යාපන සුදුසුකම්.-*

10.1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පිළිබඳ විස්තර :-

| *පළමු වර* | | | | *දෙවන වර* | | | |
|---|---|---|---|---|---|---|---|
| වර්ෂය :————. | | | | වර්ෂය :————. | | | |
| විභාග අංකය :————. | | | | විභාග අංකය :————. | | | |
| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
| 1. | | 5. | | 1. | | 5. | |
| 2. | | 6. | | 2. | | 6. | |
| 3. | | 7. | | 3. | | 7. | |
| 4. | | 8. | | 4. | | 8. | |

10.2 *අ.පො.ස (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර :-*

| *වර්ෂය හා මාසය* | | *විභාග අංකය* | |
|---|---|---|---|
| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
| 1.<br>2. | | 3.<br>4. | |

10.3 *උපාධිය පිළිබඳ විස්තර/ලබා ඇති වෘත්තීය සුදුසුකම්.-*

| *උපාධිය/ඩිප්ලෝමා වෘත්තිය සහතිකයේ නම* | *වලංගු වන දිනය* | *විෂයයන්* | *සාමාර්ථතාව* | *විශ්ව විද්‍යාලය/නිකුත් කළ ආයතනයේ නම* |
|---|---|---|---|---|
| | | | | |

11. *දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවෙකු නම්.-*

(i) දෙපාර්තමේන්තුව/ආයතනය :————.
(ii) දැනට දරන තනතුර :————.
(iii) පත්වීම් දිනය .................................... දින සිට ................................ දක්වා
සේවා කාලය : අවු. ................................
(iv) ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග :
(සේවයේ ස්ථිර කිරීමේ ලිපියේ පිටපතක් අමුණන්න.)

12. මුදල් ගෙවූ ලදුපත මෙහි නොගැලවෙන සේ අලවන්න. (ලදු පතෙහි ඡායා පිටපතක් ළඟ තබාගන්න.)

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ හා විශ්වාසය අනුව නිවැරදි සහ සත්‍ය බවත්, විභාග ශාස්තෘව ගෙවූ .................................................................. .ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක ..........................................හා ............................... දින දරන ලදුපත මෙහි අලවා ඇති බවත්, මෙම තනතුරට මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසු හෝ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත්, මම පිළිගනිමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

———————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන...............................................................මෙනවිය/ මහත්මිය/මහතා මා පෞද්ගලිකව හඳුනන බවත්, ............................ වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

———————,
(සහතික කරන්නාගේ අත්සන)

දිනය :—————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාව තබන්න.)

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතු ය.)

*ආයතන ප්‍රධානියාගේ සහතිකය/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන..................................................................... මයා/මිය/මෙනෙවිය............................................................................. කාර්යාලයේ/ ආයතනයේ........................................ දින සිට ................................................තනතුරක සේවය කරන බව ද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක වන බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි බව ද/කළ නොහැකි බව ද ඔහු/ඇය මෙතෙක් මොනයම් ආකාරයක හෝ විනායානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව ද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද, සහතික කරමි.

———————,
ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.
ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාව තබන්න.)

08-938

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.